**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 03 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ නොච්චියාගම කුකුල් මස් වෙළඳසැල අංක 01 බදුදීමේදී ආදායම් ලෙස ලැබී අගරු වී තිබුණු රු.423,333 ක වෙක්පත ණයගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අගරු චෙක්පත ණයගැතියන් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.3,752,084 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.3,475,748 ක් ලෙස දැක්වීම නිසා රු.276,336 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයේ උසාවි දඩ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | උසාවි දඩ ආදායම් විස්තර අදාළ ආයතන වෙතින් ලබාගැනීමට නොහැකිවී තිබුණි. |
| (iii) | 2013 සහ 2014 වර්ෂවලට අදාල මුද්දර ආදායම් රු.802,115 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2013 හා 2014 වර්ෂවල මුද්දර ආදායම් ලබාගැනීම සඳහා මූලාශ්‍රයන් නොවීය. |
| (iv) | 2018 වර්ෂයේ කල්බදු පදනම මත මිලදීගෙන තිබුණු බොලෙරෝ රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නොදක්වමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම රථය සඳහා | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අදාළව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ ඊට අදාළ වගකීම් දැක්විය යුතුවේ. | කල්බදු අවසන් වනතුරු වත්කමක් ලෙස හඳුනා ගනු නොලබන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති වල හා හෙළිදරව් කිරීම් |

| | | | |
|---|---|---|---|
| | රු.622,822 ක් වූ ගෙවිය යුතු කල්බදු ගාස්තු වටිනාකම දක්වා තිබුණි. | | යටතේ සටහන් කර ඇත. |
| (v) | ලංකා බැංකුවේ අංක 6286999 දරන ජංගම ගිණුමට අවස්ථා 14 කදී සෘජු ලැබීම් රු.822,762 ක් නිවැරදිව හඳුනා නොගෙන වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | බැංකුවට සෘජුවම ලැබෙන තැන්පතු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | සෘජු ලැබීම සහා අරමුදලට අයකර ගන්නා ලදී. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් රු.400,000 ක ගණනය කලහැකි වටිනාකමක් සහිතව සහ සභාව විසින් රු.4,582,557 ක වටිනාකමකින් යුතු මුදල් ලබාගැනීම සඳහා බාහිර පාර්ශවයන් 16 කට එරෙහිව පවරා තිබුණු නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | පිළිගනිමි |

(ඇ) නොසැසඳීම්

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හිඟහිටි කුලී ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව රු.11,675,532 ක් වුවද උපලේඛන අනුව රු.10,656,567 ක් වුයෙන් රු.1,018,965 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(i) ලැබිය යුතු ගිණුම්

-------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ❖ | වසර 06 කට පෙර සිට අය නොවී පවතින රු.11,843,472 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | |
|---|---|---|
| ❖ වසර 05 සිට වසර 21 ක් දක්වා කාලපරිච්ඡේදයක සිට අය නොවෙමින් පවතින රජයේ දේපල 19 කින් ලැබිය යුතුව තිබුණු රු.714,228 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ii) ගෙවිය යුතු ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 05 කට පෙර සිට පවතින රු.908,422 ක් වූ නොගෙවූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හා පාරිතෝෂික ශේෂය නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.9,269,702 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව පිලිගත හැකි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.33,426,347 ක් වටිනා ආදායම් විෂයයන් 52 ක් හා රු.45,627,853 ක් වටිනා වියදම් විෂයයන් 46 ක් ආදායම් වියදම් ගිණුමට මාරුකිරීමට අදාළ ජ'නල් සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පොදු ලෙජරයේ ආදායම් වියදම් ගිණුම් තුලනය කිරීමෙන් පසු ලබාගත් ශේෂය ආදායම් හා වියදම් ගිණුමට මාරු කරන ලද අතර මේ සඳහා ජ'නල් සටහනක් නොතබන ලදී. 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උපවගන්තිය | | වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනත අනුව වාර්තා ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 203 අධිකාරිය | 12,788,184 | සභාව සතු වාහන 05 ක් ලියාපදිංචි නොකර ධාවනයේ යොදවා තිබුණි. | සභාව සතු වාහන ලියාපදිංචිය සඳහා කටයුතු කළ යුතුවේ. | වාහන ලියාපදිංචිය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) | මු.රෙ 189 | 445,483 | අගරු චෙක්පත් 02 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |
| (ii) | මු.රෙ.1647(ඉ) | - | සභාව සතු සියළු වාහන සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 19 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,808,419 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,229,079 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,518,970 | 4,564,085 | 5,693,730 | 4,117,848 | 2,568,970 | 2,477,805 | 1,824,083 | 5,247,493 |
| (ii) | කුලී | 5,752,300 | 8,595,700 | 4,656,725 | 11,675,532 | 6,455,300 | 3,863,580 | 3,518,130 | 7,736,557 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 20,623,900 | 7,053,647 | 3,525,331 | 9,357,077 | 16,995,700 | 6,299,480 | 6,248,120 | 5,828,761 |
| (iv) | වෙනත් ආදායම් | 12,296,600 | 13,212,915 | 11,787,387 | 4,017,372 | 18,251,000 | 12,030,488 | 12,950,813 | 2,592,204 |
| | | 41,191,770 | 33,426,347 | 25,663,173 | 29,167,829 | 44,270,970 | 24,671,353 | 24,541,146 | 21,405,015 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව දියුණු කල ප්‍රදේශ ගැසට් මගින් ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුවේ. | මෙම වරිපනම් තක්සේරුව පිළිබඳව ගොනුවක් හෝ අදාළ කිසිදු මූලාශ්‍රයක් කාර්යාලය තුළ සොයාගැනීමට නොහැකි වීමෙන් මේ පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි විය. |
| (ආ) | 2005 වර්ෂයේ සිදුකල තක්සේරුව මත වරිපනම් අයකරමින් තිබුණු අතර වසර 13 ක කාලයට අදාළව නව ඉදිකිරීම්, වෙනස් කිරීම් ආදිය සම්බන්ධව තාවකාලික තක්සේරු මත හෝ වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වසර 05 කට වරක් තක්සේරු සංශෝධනය කල යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 කුලී

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉදිකර කුලියට ලබාදුන් කඩකාමර 27 ක හිමිකම් සහතික නොමැතිවීම නිසා කඩ කුලී ගෙවීම පැහැර හැරීම මත අයකර ගත නොහැකි ආදායම රු.6,222,900 ක් විය. | හිඟ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමර පිහිටි ඉඩම්වල අයිතිය පිළිබඳව පවතින ගැටළුකාරී තත්ත්වයක් හේතුවෙන් මෙම තත්ත්වය උදාවී ඇත. |

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති 59-66 ප්‍රකාරව ව්‍යාපාරික ස්ථාන හඳුනා ගැනීම සඳහා පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

2.2.5 වෙනත් ආදායම්

------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2013 සිට 2018 දක්වා වර්ෂවලට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රධාන ලේකම් වෙතින් විමසා නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණු අතර මුද්දර බදු සම්බන්ධව ලේඛන විධිමත්ව පිළියෙල කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන ලේකම් වෙතින් මෙම මුද්දර ගාස්තු ප්‍රමාණය විමසා නිරවුල් කර ගැනීමට හා නිසි පරිදි ලේඛන පවත්වාගෙන යාමටත් කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ඉහළ වැටියාව, කුකුල් කටුව, හොරුවිල, නොච්චියාගම යන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ මුදල රු.4,017,372 ක් වූ අතර එය සාමාන්‍ය වාර්ෂික බිල්කල වටිනාකම වන රු.15,886,987 කින් සියයට 25 ක් විය. | හිඟ ජල ආදායම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ජනවාරි මස හිඟ ජල ගාස්තු සම්බන්ධව රතු නිවේදන යවන ලද අතර ජංගම හිඟ ජල ගාස්තු රැස්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. | ආදායම් රැස්කිරීම් වෙළඳ බලපත්‍ර, දැන්වීම් පුවරු ආදී කාරණා සම්බන්ධව සම්මත අතරු ව්‍යවස්ථා කිහිපයක් පමණක් වැළඳගෙන ඇති අතර අනෙකුත් කාරණා සම්බන්ධව සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීමට හෝ නව අතුරු ව්‍යවස්ථා සකසා පැනවීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නොච්චියාගම අංක 01 කුකුල් මස් වෙළඳසැල බදු මුදල් වෙනුවෙන් සභාවට ලැබී තිබුණු රු.423,333 ක චෙක්පත අගරු වී තිබුණු නමුත් හිඟ මුදල් අයකර ගත නොහැකි වී තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නොච්චියාගම කුකුල් මස් වෙළෙඳසැල අංක 01 බදුකරු ලබාදුන් රු.423,333 ක අගරු චෙක්පත සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම බදුකරු විදේශගත වී ඇති බැවින් හිඟ මුදල් අයකර ගැනීමට නොහැකිවී ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවට අයත් එකතුව රු.14,346,231 ක්වූ වත්කම් 08 ක් හා වටිනාකම හඳුනා නොගත් වත්කම් ඒකකයක් නිශ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්යව පවතින වත්කම් සභාවේ ප්‍රයෝජනය සඳහා දායක කර ගත යුතුවේ. | මෙම වත්කම් වෙනත් ආයතන වලට පැවරීමට, අළුත්වැඩියාවට, වෙන්දේසියට හා වෙනත් ව්‍යාපෘති සඳහා භාවිතා කිරීමට සැලසුම් කරමි. |

### 3.3.2 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නොච්චියාගම ප්‍රාදේශීය සභා පුස්තකාලයේ රු.93,922 ක් වූ පොත් 453 ක් අස්ථානගතව පැවති බව අනාවරණය වී තිබුණි. 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය ප්‍රකාරව ඒ පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අස්ථානගත වූ පොත් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අස්ථානගත වූ පොත් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. |

### 3.3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් පත් කළ කමිටුවක් මගින් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේදී වටිනාකම සියයට 205 කින් හා යන්ත්‍රෝපකරණ වටිනාකම සියයට 1082 කින් වැඩිවීමක්ද, වාහන වටිනාකම සියයට 85 කින් අඩුවීමක්දසිදුවී තිබුණි. | සුදුසුකම් ලත් කමිටුවක් මගින් තක්සේරු කර ප්‍රත්‍යාගණනය කළ යුතුවේ. | 2018.12.31 දිනට සභාව සතු සියලු වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නිවැරදි සමීක්ෂණයක් සිදුකර වත්කම් වර්ගීකරණය කොට ප්‍රත්‍යාගණිත වටිනාකම් යොදා මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඇත. මෙම අදාළ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කරන ලදි. |